**ශීර්ෂය 308 - තැපැල් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

---

ශීර්ෂය 308 - තැපැල් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 30 දින තැපැල්පතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 12,486.50 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු. මිලියන 12,419.73 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 66.77 ක් හෙවත් සියයට 0.53 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

**2016 දෙසැම්බර් 31 දිනට**

| වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 12,348.50 | 12,284.17 | 64.33 | 0.52 |
| මූලධන | 138.00 | 135.56 | 2.44 | 1.77 |
| එකතුව | 12,486.50 | 12,419.73 | 66.77 | 0.53 |

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම රු. මිලියන 7,000 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. මිලියන 6,578 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 93.97 ක් වී තිබුණි.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම / (උණතාවය) ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම / (ඌනතාවය) | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.01.02.00 | 7,000 | 6,578.13 | (422) | (6.03) |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 30801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 750.00 | 749.72 | 640.00 | 701.58 | 2,400.00 | 1,707.51 |

## 2.4 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0098/0016/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු. මිලියන 3,494.62 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 06 ක 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. මිලියන 54.35 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0001/0038/000 | 3.08 |
| 6000/0000/00/0002/0049/000 | 0.70 |
| 6000/0000/00/0013/0039/000 | 7.65 |
| 6000/0000/00/0016/0002/000 | 10.08 |
| 6000/0000/00/0018/0009/000 | 32.75 |
| 6000/0000/00/0020/0027/000 | 0.09 |
| එකතුව | 54.35 |

## 2.6 විගණන නිරීක්ෂණය

තැපැල් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
| --- | --- |
| (i) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

### 3.2 අග්‍රිම ගිණුම

(අ) මුදල් රෙගුලාසි 427 (2) අනුව මාස්පතා අග්‍රිම ගිණුම භාණ්ඩාගාරයේ ගිණුම සමඟ සැසඳිය යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ආ) 2017 ජනවාරි 01 දිනට භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු මුදලින් රු. 70,000,000 ක් 2017 ජනවාරි 05 දින හා රු. 200,000,000 ක් 2017 ජනවාරි 09 දින ප්‍රේෂණය කර තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට, ලබා දී තිබූ උප අත්තිකාරම් පියවිය යුතු වුවත් රු. 340,721 ක අත්තිකාරම් පියවා නොතිබුණි. එසේම ප්‍රාදේශීය කාර්යාලවලට ලබාදී තිබූ රු. 423,852,026 ක ශේෂයන් පියවා නොතිබීමද අග්‍රිම ශේෂය ශූන්‍ය නොවීමට හේතු වී තිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 371 (2) (ඇ) ප්‍රකාරව අදාල කාර්යය නිමවූ වහාම ලබාගත් අත්තිකාරම පියවිය යුතු වුවත් අවස්ථා 18 කදී ලබාගත් එකතුව රු. 513,330 ක් දින 11 සිට මාස 06 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි.

(ඉ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රජය මුදල් චක්‍රලේඛයේ (ආ) වගන්තියට අනුව කිසියම් විශේෂිත කාර්යයක් සඳහා එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි වුවත් අධ්‍යක්ෂ (පුහුණු) වෙත එකම කාර්යය සඳහා අවස්ථා 03 කදී රු. 100,000 බැගින් රු.300,000 ක් ලබා දී තිබුණි.

### 3.3 පොදු තැන්පත් ගිණුම

2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ දෙකක් ඉක්ම වූ රු. 4,096,704 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි.

**3.4 බැරකම්**

(අ) මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොබැඳිය යුතු නමුත් වැය විෂයයන් 11 කට අදාලව ප්‍රතිපාදනය උපයෝජනය කළ පසු වූ ඉතිරිවීම් ඉක්මවා රු.73,284,551 ක බැඳීම් ඇතිකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2017 වර්ෂයේදී ගෙවන ලද රු. 6,756,461 ක් වටිනා බැරකම් විසර්ජන ගිණුමේ දක්වා නොතිබෙන බව තැපැල් මූලස්ථානයේ හා මුද්දර ගබඩා කාර්යාලයේ සිදු කල නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය.

**3.5 ආදායම් ගිණුම**

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේත අංක 20-01-02-00 හි ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**3.5.1 නිවැරදි අගයන් ගිණුමේ නොපෙන්වීම**

(අ) 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු. 7,500,000,000 ක් වුවද ආදායම් ගිණුමේ එය රු. 8,193,650,390 ක් වශයෙන් රු. 693,650,390 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුව අනුව ආදායම රු.7,000,000,000 ක් වුවද ආදායම් ගිණුමේ එය රු. 6,999,697,823 ක් වශයෙන් රු. 302,177 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**3.5.2 ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම**

(අ) ඇස්තමේන්තුගත ආදායම රු. 7,000,000,000 ක් වුවද රු. 421,866,364 ක් අඩුවෙන් රැස්කර තිබුණි.

(ආ) තවද ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී තාත්වික සංඛ්‍යා භාවිතා නොකර කල්පිත සංඛ්‍යා භාවිතා කිරීම නිසා ඒ ඒ විෂයයන්ගේ ඇස්තමේන්තුගත ආදායමෙහි හා තථ්‍ය ආදායමෙහි සියයට 10 සිට සියයට 810 දක්වා ධන විචලනයන් හා සියයට 27,788 දක්වා සෘණ විචලනයක් විය.

**3.5.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

(අ) 2002 ජූලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයට අනුව නිසි ලෙස පිළියෙල කළ ත්‍රෛමාසික ආදායම් වාර්තා එම කාලසීමාව අවසන් වූ දින සිට දින 15 ක් ඇතුළත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ආ) 2006 සැප්තැම්බර් 27 දිනැති අංක 187/2006 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 04 ඡේදය පරිදි රැස්කරනු ලබන දත්ත පදනම් කරගෙන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් මාසිකව පිළියෙල

කරනු ලබන ගිණුම් ප්‍රකාශ සමඟ දෙපාර්තමේන්තු පොත් අනුව පෙන්වන අගයන් සැසඳීම් වාර්තාවක් ඊළඟ මස අවසන් දිනට ප්‍රථම රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2016 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වාත්, දෙසැම්බර් මාසයේත් වාර්තා ඉදිරිපත් කිරීමේදී දින 12 සිට දින 90 දක්වා වූ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

### 3.5.4 ආදායමින් ආපසු ගෙවීම

-----------------------------

මුදල් රෙගුලාසි 118 ප්‍රකාර රාජ්‍ය ආදායමට බැරකරන ලද මුදල් ආපසු ගෙවීමේදී භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ ගෙවා තිබූ රු. 1,681,610 ක් සඳහා මෙම අනුමැතිය ලබාගෙන නොතිබුණි.

### 3.5.5 සන්නිවේදන පියස් ආදායම

--------------------------------

(අ) 2016 වර්ෂයේ සන්නිවේදන පියස් ආදායම රු. මිලියන 1.37 ක් වුවද 2015 වර්ෂයේ එය රු. මිලියන 7.00 ක් වුයෙන් ආදායම රු. මිලියන 5.63 කින් එනම් සියයට 81 කින් පහත වැටී තිබුණි. කෙසේ වුවත් 2000 නොවැම්බර් 07 දිනැති තැපැල්පතිගේ අංක 14/2000 දරන චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව ලාභය/ අලාභය හඳුනා ගත යුතු වුවත් එසේ නොකර සන්නිවේදන පියස්වල ලැබීම් හා ගෙවීම් ගිණුම් ගත කිරීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි. එබැවින් ආදායම ලෙස දක්වා ඇති අගයන් තාත්වික පදනමින් ලබාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට තැපැල් අලෙවිසැල් ආදායම ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වුවත් එසේ නොකර රු. 2,196,112 ක් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

### 3.5.6 ආදායම් පහළ යාම

-----------------------

තැපැල් දෙපාර්තමේන්තුව විසින් උපයන ලද ආදායම, දැරූ වියදම පසුගිය වර්ෂය හා සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2016 | 2015 | වෙනස | වැඩිවීම/(අඩුවීම) ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| ආදායම | 6,578 | 6,710 | 132 | 1.97 |
| වියදම | 12,284 | 11,756 | 528 | 4.5 |
| මෙහෙයුම් උනතාවය | 5,706 | 5,045 | 661 | 13 |

(අ) ඉකුත් වර්ෂයේ සමස්ථ ආදායම වූ රු. මිලියන 6,710 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ආදායම රු. මිලියන 6,578 ක් වූයෙන් ආදායම් වර්ධනයෙහි ඉකුත් වර්ෂය සමඟ සැසඳීම් කළ විට රු. මිලියන 132 ක් සියයට 1.97 ක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම ආදායම් පහළ යාමට හේතු වූ කරුණු අතර විශේෂයෙන් වෙළඳපොල සමගාමී සේවා සපයන ආයතන වෙතින් එල්ල වී ඇති

තරගකාරීත්වය ,මුද්දර ආදායම අඩුවීම හා තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා විශේෂයෙන්ම හේතු වී තිබුණි.

(ආ) පසුගිය වර්ෂය හා සැසඳීමේදී මෙහෙයුම් ඌනතාවය සියයට 13 කින් වැඩිවී තිබුණි. මේ සඳහා මෙහෙයුම් වියදමේ වැඩිවීම බලපා තිබුණි.

(ඇ) 2007 වර්ෂයේදී ආරම්භ කර 2014 වර්ෂයේදී නිම වූ තැපැල් කාර්යාල ජාලගත ව්‍යාපෘතියෙහි අරමුණුවලින් එක් අරමුණක් වනුයේ තැපැල් දෙපාර්තමේන්තුව දිගින් දිගටම අලාභ වීම වලක්වා ආදායම හා වියදම සම තත්ත්වයේ පවත්වාගෙන යාමයි. නමුත් දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුළදීද ලබා තිබුණ මෙහෙයුම් ඌනතාවය රු. මිලියන 5,706 ක් විය. එය පසුගිය වර්ෂයේ ඌනතාවයට සාපේක්ෂව රු. මිලියන 661 ක වැඩිවීමකි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 30801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නොසැසඳීම්**

කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ශේෂය හා දිසා ගිණුම් කාර්යාලවල පාලන ගිණුම්වල ශේෂය පිළිවෙලින් රු. 1,698,646,560 ක් හා රු. 1,707,336,594 ක් වූයෙන් වෙනස රු. 8,690,034 ක් විය.

**(ආ) අය නොවී පවතින ශේෂ**

විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට අය නොවී පවතින ණය ශේෂ එකතු වටිනාකම රු. 65,897,858 ක් විය. එම ශේෂයෙහි වසර 05 ක සිට වසර 35 ක කාලයක් දක්වා අය නොවී පවතින ණය ශේෂයන්ගේ එකතුව රු.29,516,209 ක් විය.

**(ඇ) සීමාව ඉක්මවා ආපදා ණය ගෙවීම්**

2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව රජයේ සේවකයකු සඳහා ගෙවිය හැකි සමස්ථ ආපදා ණය ප්‍රමාණය රු. 250,000 කට සීමා කර තිබුණද, නිලධාරීන් 22 දෙනෙකුට එම සීමාව ඉක්මවා ආපදා ණය ගෙවා තිබුණි.

## 3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.7.1 අභ්‍යන්තර විගණනය

(අ) අභ්‍යන්තර විගණන අංශයේ අනුමත විගණන නිලධාරීන් සංඛ්‍යාව 89 ක් වුවද ගිණුම් පරීක්ෂණ නිලධාරීන් 09 දෙනෙකු ඇතුළුව නිලධාරීන් 19 දෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. මේ හේතුවෙන් ඵලදායී හා කාර්යක්ෂම විගණනයක් සිදුකිරීමට නොහැකි වී තිබුණි.

(ආ) 2015 වර්ෂයේදී හා 2016 සැප්තැම්බර් වන විට තැපැල් කාර්යාල 653 කින් තැපැල් කාර්යාල 167 ක් හා ගිණුම් කාර්යාල 16 කින් ගිණුම් කාර්යාල 01 ක් පමණක් විගණනය කර තිබුණි. මෙහිදී උප තැපැල් කාර්යාල පරීක්ෂා කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්මේ ඇතුලත් කර තිබූ ප්‍රධාන කාර්යාලයේ කාර්යයන් 08 ක් හා මධ්‍යම තැපැල් හුවමාරුවේ කාර්යයන් 08 ක් සිදුකර නොතිබුණි.

## 3.8 වත්කම් කළමනාකරණය

-----------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### 3.8.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජන වත්කම්

-------------------------------------

වෙන්දේසි කිරීමට නියමිතව තිබූ වාහන 05 ක අමතර කොටස් සොරාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදුකිරීමේ ප්‍රමාදය හේතුවෙන් මෙම වාහන නාරාහේන්පිට ගරාජයේ දිරාපත් වෙමින් තිබුණි.

### 3.8.2 වත්කම් පවරා නොගැනීම

---------------------------

(අ) පළාත් 9 ට අයත් තැපැල් කාර්යාලවලට අයත් ඉඩම්වලින් විධිමත් ලෙස පවරා ගන්නා ලද ඉඩම් ප්‍රමාණය ඒකක වශයෙන් 87 ක් වූ අතර භුක්තියට පමණක් භාරගන්නා ලද ඉඩම් ප්‍රමාණය ඒකක 120 ක් විය. මෙතෙක් පවරා නොගන්නා ලද ඉඩම් ප්‍රමාණය ඒකක 68 ක් විය. මෙම ඉඩම් ප්‍රමාණයේ වර්ග ප්‍රමාණය කොතෙක්ද යන්න හඳුනාගෙන නොතිබුණි.

(ආ) දිවයින පුරා තැපැල් කාර්යාල 652 ක් පැවතියද එයින් 448 ක අයිතිය තැපැල් දෙපාර්තමේන්තුවට පවරා ගෙන නොතිබුණි.

### 3.8.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

------------------------------------------

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තාව 2017 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කෑගල්ල, කොළඹ උතුර හා දකුණ යන තැපැල් අධිකාරී කොට්ඨාශවල 2017 ජූලි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3.9 කාර්යසාධනය

------------------

(අ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා මූලධන වැය ප්‍රගති වාර්තාව පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘති ක්‍රියාවට නංවා නොතිබුණ අතර ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ව්‍යාපෘති 57 ක් සංශෝධනය කර තිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්මේ නොමැති ගොඩනැඟිලි අළුත්වැඩියා කිරීම් හා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් 47 ක් ක්‍රියාත්මක කර තිබුණි.

(iii) ක්‍රියාකාරී සැලැස්මේ හා ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් කර නොමැති මෝටර් සයිකල් 13 ක් රු. 3,348,849 කට මිලදී ගෙන තිබුණි.

**(ආ) විමර්ශනයන් සිදුකිරීමේ කාර්ය සාධනය**

**-------------------------------------------**

(i) ආයතන සංග්‍රහයේ 11 කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 13.1 උප වගන්තිය ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ මූලික විමර්ශන කටයුතු සිදු නොකර විමර්ශන 2,684 ක් පැවති අතර ඒවා වසර 01 සිට වසර 18 දක්වා කාල පරාසයකට අයත් විය.

(ii) ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 22:1:1 උප වගන්තිය සංශෝධන ලෙස 2011 දෙසැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2004(1) ප්‍රකාරව චූදිත නිලධාරියෙකුට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කර වසරක් ඇතුලත අදාල පරීක්ෂණ නිමකර විනය නියෝග නිකුත් කිරීමට විනය බලධාරියා අවශ්‍ය පියවර ගත යුතු වේ. එසේ වුවත් මූලික පරීක්ෂණ 10 ක වැඩ අවසන් කර චෝදනා පත්‍ර නිකුත් කිරීමට වසර 01 සිට වසර 09 දක්වා කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි.

(iii) ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 31:11 උප වගන්තියේ සඳහන් චෝදනා යටතේ වැඩ තහනමට ලක්ව ඇති චූදිත නිලධාරියෙකුට විනය නියෝග ලබාදීමට ප්‍රථම නැවත සේවයේ පිහිටුවිය නොහැකි බව දන්වා ඇතත් ඊට පටහැනිව බරපතල ගනයේ ලා සැලකිය හැකි රජයේ මුදල් හා දේපල සාවද්‍ය පරිහරණයට ගෙන ඇති අවස්ථාවලදී නැවත සේවයේ පිහිටුවා තිබුණි. එවැනි අවස්ථා 08 ක් අනාවරණය වූ අතර එහි මූල්‍ය වටිනාකම රු. මිලියන 16 ක් විය.

(iv) අධිකරණවල විභාග වෙමින් පවතින මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමුකර ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන්ද දෙපාර්තමේන්තු පරීක්ෂණ පවත්වා විනය නියෝග ලබාදීමට කටයුතු කළ යුතු වුවත් එකතුව රු. 9,680,690 ක් වූ මූල්‍ය අක්‍රමිකතා සඳහා එසේ කටයුතු කර නොතිබුණි.

(v) විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත්කොට ඇති වාර්තා මගින් හෝ අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා මගින් අක්‍රමිකතාවයක් හෝ විෂමාචාරයක් හෝ සිදුකර ඇති බව පෙන්වා දී ඇති අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 29.1, 29.2, 29.3 ට අනුව විධිමත් විනය පියවර අදාල විනය බලධරයා විසින් අනිවාර්යයෙන්ම ගතයුතු වුවද එවැනි අවස්ථා 07 කදී රු. 189,182,368 ක විමර්ශන කටයුතු නිමකර නොතිබුණි.

(vi) සහකාර තැපැල් අධිකාරී (විමර්ශන) අනුමත සංඛ්‍යාව 51 ක් විය. 2016 දෙසැම්බර් 31 දිනට තථ්‍ය සේවක සංඛ්‍යාව 32 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනමෙන් 04 දෙනෙකු විය. පවතින නිලධාරී හිගය නිසා නිලධාරීන්ගෙන් 16 දෙනෙකු පමණක් විමර්ශන රාජකාරීවල යොදවා ඇති බවත්, විමර්ශන මන්දගාමී වීමට මෙම තත්ත්වය බලපා ඇති බවත් තැපැල්පතිවරයාගේ අදහස විය. එසේ වුවද දැනට අනුයුක්ත නිලධාරීන් විසින් සිදු කරනු ලබන විමර්ශන කටයුතුවල ප්‍රගතිය ඉතාම පහළ අගයක් පැවතුණි.

## 3.10 අවිධිමත් ගනුදෙනු

-----------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### 3.10.1 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

------------------------------------------------------------------------------------------

(අ) පූජාපිටිය තැපැල් කාර්යාල නව ගොඩනැඟිල්ල ඉදිකිරීම

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1(ඇ) ප්‍රකාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කිරීමට ප්‍රථම ප්‍රතිපාදන වෙන් කර ගැනීම, භූමිය පිළිබඳ සමීක්ෂණ වාර්තා ලබා ගැනීම, ටෙන්ඩර් කැඳවීම හා සැලැස්ම සකස් කිරීම කළ යුතු වුවත් එසේ නොකර 2015 ජුනි මස 14 වෙනි දින මෙම ඉදිකිරීම සඳහා මුල් ගල තැබීම සිදුකර තිබුණි.

(ii) ඉදිකිරීම් කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරා තිබුණ අතර 2016 දෙසැම්බර් 31 දින වන විට මෙම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදලින් සියයට 36 ක් එනම් රු. 23,502,163 ක් ගෙවා තිබුණු නමුත් අදාළ කළවැඩ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමඟ 2016 සැප්තැම්බර් 15 දින අත්සන් කර ලද ගිවිසුම අනුව 2017 සැප්තැම්බර් 30 දින මෙහි වැඩ අවසන් කළ යුතු වුවත් 2017 ජූලි මස වන විටත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

(iv) මෙම තැපැල් සංකීර්ණය 2016 වසරේ වැඩ ආරම්භ කර හෝ නොතිබුණද රු. 16,032,294 ක වත්කමක් ගිණුමේ පෙන්වා තිබුණි.

(ආ) අනුරාධපුරය තැපැල් සංකීර්ණ නව ගොඩනැඟිල්ල ඉදි කිරීම

-------------------------------------------------------------------

අනුරාධපුරය තැපැල් කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදි කිරීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට භාර දී තිබුණ අතර 2010 ජනවාරි 19 දින ඉදි කිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. ඒ පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මහල් තුනකින් යුක්තව ඇස්තමේන්තු වටිනාකම රු.94,750,000 කට වර්ග අඩි 16,275 ක බිම් ප්‍රමාණයක් සහිත මෙම ඉදි කිරීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මඟින් 2010 වර්ෂයේ දී ආරම්භ කර තිබුණත් බිම් මහල හා පළමු මහල පමණක් නිමකර 2013 නොවැම්බර් 10 දින කාර්යාල කටයුතු සඳහා විවෘත කර තිබුණි.

(ii) මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භයේදී මහල් 03 කට අඩිතාලම හා කොන්ක්‍රීට් වැඩ සිදුකර තිබියදී පසුව මහල් 05 ක් දක්වා වැඩිකර ඒ සඳහා රු. මිලියන 155 ක් අනුමත කරගෙන තිබුණි.

(iii) ශ්‍රී ලංකාවේ වත්මන් නාගරික සංවර්ධන නිර්නායකයන්ට අනුව ඉහළ ආර්ථිකමය වටිනාකමකින් යුතු ඉඩම් වල ගොඩනැගිලි ඉදි කිරීමේ දී අනාගත අපේක්ෂාව ද සලකා ගොඩනැගිලි නිර්මාණය කිරීම කල යුතු වුවත් මෙම ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීමේදී එසේ කර නොතිබුණි.

(iv) ගොඩනැගිල්ලේ කොටසක් ඉදි කිරීමෙන් පසු 2015 දෙසැම්බර් 09 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමඟ එකඟ වූ ගිවිසුමට අනුව වැඩ අවසන් කළයුතු දිනය 2016

නොවැම්බර් 18 දින වුවද 2017 මාර්තු 15 දක්වා දින දීර්ඝ කර තිබුණ අතර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අවුරුදු 07 ක් ගත වී තිබුණි.

(v) කළ වැඩ වාර්තා ලබා නොගෙන ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට 2016 දෙසැම්බර් 23 දින වන විට රු. 84,460,939 ක් ගෙවා තිබුණි.

**3.11 පාඩු හා හානි**

**---------------**

වර්ෂ 1984 සිට 2010 අතර කාල පරාසයක සිට පැවත එන කපා හැරීමට හෝ අයකර ගැනීමට කටයුතු නොකළ අලාභ හානි වටිනාකම රු. 11,978,671 ක් විය.

**3.12 කළමනාකරණ දුර්වලතා**

**------------------------------**

නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**3.12.1 මුදල් ඇණවුම් සේවා ගිණුම**

--------------------------------

**මුදල් ඇණවුම් සේවා සැසදුම් ප්‍රකාශය - 2015**

**---------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) තැපැල් දෙපාර්තමේන්තුව විසින් මුදල් ඇණවුම් ගනුදෙනුවලට අදාලව පරිගණක මෘදුකාංග හඳුන්වා දී වසර ගණනාවක් ගත වී තිබුණි. එම මෘදුකාංගයේ පවතින අඩුපාඩු හේතුවෙන් එමගින් ලබාගෙන තිබූ තොරතුරු නිවැරදි නොවීය. මුදල් ඇණවුම් නිකුත් කිරීම, මුදල් ඇණවුම් ගෙවීම් කිරීම සහ මුදල් ඇණවුම් කොමිස් අදායම අතර පිළිවෙලින් රු. 826,396,815 රු. 832,549,569 හා රු. 1,547,533 ක වෙනස්කම් ඇති වී තිබුණි.

(ii) මුදල් ඇණවුම් නිකුත් කිරීම් හා ගෙවීම්, ගිණුම් ගත කිරීමේදී වරදවා ගිණුම් ගත කිරීම්, අතපසු වීම් නිසා අඩුවෙන් සහ වැඩියෙන් ගිණුම්ගත කිරීම් විශාල වශයෙන් සිදු වී තිබුණි. මෙම තත්ත්වය දිගින් දිගටම සිදුවී තිබුණ අතර එම තත්ත්වය මගහැරීමට දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) 2016 මුදල් ඇණවුම් සේවා ගිණුම 2017 අගෝස්තු 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**3.12.2 අතිකාල ගෙවීම**

**-------------------**

2015 වර්ෂයේදී අතිකාල හා නිවාඩු දින වැටුප් වියදම රු. මිලියන 640.9 ක් හා 2016 වර්ෂයේදී එය රු. මිලියන 776.6 ක් වී තිබුණි. ඒ අනුව අතිකාල ගෙවීම පාලනය කිරීමට කටයුතු කර නොතිබුණ බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යා පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 121 | 87 | 34 |
| (ii) | තෘතීයික මට්ටම | 147 | 54 | 93 |
| (iii) | ද්විතික මට්ටම | 8,854 | 8,045 | 809 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17,659 | 12,696 | 175 |
| (v) | වෙනත් - ආදේශක කොන්ත්‍රාත් පදනම | | 4,788 | |
| | | | 05 | |
| | එකතුව | 26,781 | 25,675 | 1,111 |

(i) 06/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර තැපැල් දෙපාර්තමේන්තු නිලධාරීන් හා සේවකයින් සඳහා නව සේවා ව්‍යවස්ථාවක් අනුමත කර නොතිබුණි.

(ii) කොන්ත්‍රාත් පදනමින් ආදේශක සේවකයින් 4,788 ක් බඳවා ගෙන තිබුණ අතර එම තනතුර සඳහා ස්ථිර සේවකයින් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ස්ථාන මාරුකිරීම් විධිමත් ආකාරයෙන් ක්‍රියාත්මක කර නොතිබුණි. ඉතා දිගු කාලයක් එකම කාර්යාලයේ සේවය කිරීම හා ස්වාමි පුරුෂයා හා බිරිඳ එකම සේවා ස්ථානයේ සේවය කළ අවස්ථා විය.